**කොවිඩ් 19 සති පාසල - 9 වන ශ්‍රේණිය - මාර්තු දෙවන සතිය**

# <u>සරල රේඛා හා සමාන්තර රේඛා ආශ්‍රිත කෝණ</u>

- පෙර දැනුම සිහිපත් කර ගැනීම සඳහා පුනරීක්ෂණ අභ්‍යාසය කරන්න.

## සරල රේඛා ආශ්‍රිත කෝණ




ප්‍රමේයයඃ

එක් සරල රේඛාවක් තවත් සරල රේඛාවකට හමුවීමෙන් සෑදෙන බද්ධ කෝණ දෙකේ ඓක්‍යය සෘජුකෝණ දෙකකට සමාන වේ.

$\hat{AOB} + \hat{BOC} = 180^0$ (සරල රේඛාවක් මත පිහිටි කෝණවල එකතුව $180^0$ කි.)

උදාහරණඃ 1. x හි අගය සොයන්න.




$\hat{AOC} + \hat{COD} + \hat{BOD} = 180^0$ (AOB සරල රේඛාවක් මත පිහිටි කෝණ)

$2x + x + 60^0 = 180^0$

$2x + x = 180^0 - 60^0$

$\frac{3x}{3} = \frac{120^0}{3}$

$X = 40^0$

- මේ අනුව 8.1 අභ්‍යාසය කරන්න.

# ප්‍රතිමුඛ කෝණ



ප්‍රමේයයඃ

සරල රේඛා දෙකක් එකිනෙක ඡේදනය වීමෙන් සෑදෙන ප්‍රතිමුඛ කෝණ සමාන වේ.

$\mathbf{A\hat{O}B = C\hat{O}D}$

උදාහරණඃ 1. රූපයේ AB හා CD සරල රේඛා O හිදී එකිනෙක ඡේදනය වේ. $A\hat{O}D = 70^0$ නම් $B\hat{O}C$ හි අගය සොයන්න.



$A\hat{O}D = B\hat{O}C$ ( ප්‍රතිමුඛ කෝණ)

$A\hat{O}D = 70^0$

එම නිසා, $B\hat{O}C = 70^0$

- මේ අනුව 8.2 අභ්‍යාසය කරන්න.